*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

**7 ශ්‍රේණිය** **කතෝලික ධර්මය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකය: |
|---|

## I කොටස

- අංක 01 - 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. තණ්හාව ඇති කර ගැනීම තුළින් කඩකර ගනු ලබන පනත වන්නේ,

(1) 7 වන පනත (2) 10 වන පනත
(3) 6 වන පනත (4) 8 වන පනත

02. විජයග්‍රහණයේ අප ස්වාමිදූවගේ මංගල්‍ය සමරනු ලබන්නේ,

(1) ඔක්තෝම්බර් 07 (2) නොවැම්බර් 07
(3) දෙසැම්බර් 10 (4) මැයි 05

03. ප්‍රසාද ස්නාපන පිළිවෙතේ වැදගත් ම අවස්ථාව වන්නේ,

(1) සාන්තුවර පිහිට ඇයදීම.
(2) දරුවාගේ හිස මත අත තබා යැදීම.
(3) හිස මත ජලය වත්කරමින් ප්‍රසාද ස්නාපනය කිරීම.
(4) ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීම.

04. ඊසාක් යන්නෙහි අර්ථය වන්නේ,

(1) සිනාසීමයි. (2) ආශිර්වාදයයි.
(3) දෙවියන් වහන්සේ ගළවන සේක යන්නයි. (4) දෙවියන් වහන්සේගේ මිත්‍රයා යන්නයි.

05. ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය සිහි කරනු ලබන පාද නමස්කාරයේ ස්ථාන,

(1) 12 කි. (2) 9 කි.
(3) 13 කි. (4) 14 කි.

06. වර්තමානයේ අප භාවිතා කරන ජපමාල බැතිය හඳුන්වා දුන්නේ,

(1) II වන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා
(2) V වන පියුස් ශුද්ධෝත්තම පියතුමා
(3) සාන්ත ඩොමිනික් ගුස්මාන් පියතුමා
(4) XI වන ක්ලෙමන්ට් ශුද්ධෝත්තම පියතුමා

07. යාම යැදුම තුළ අනිවාර්යයෙන්ම භාවිතා වන්නේ,

(1) ප්‍රේම ගීය. (2) ගීතාවලියේ ගීතිකාය.
(3) කිතුබැති ගීතිකාය. (4) දේව ප්‍රශංසාය.

08. ආබ්‍රහම් යන්නෙහි අර්ථය වන්නේ,

(1) ජාතීන්ගේ පියාණෝය. (2) උතුම් පියාණෝය.

(3) විශ්වයේ පියාණෝය. (4) ගැලවීමේ පියාණෝය.

09. පූජකවරය දානය කරනු ලබන්නේ,

(1) පියතුමාය. (2) කාදිනල් හිමිපාණෝය.

(3) පාප් වහන්සේය. (4) රදගුරු හිමිපාණෝය.

10. ජේසුස් වහන්සේ රේගුපොළේදී තෝරාගත් ශ්‍රාවකයා වන්නේ,

(1) ශු. ජුවාම් තුමාය. (2) ශු. ජාකොබ් තුමාය.

(3) ශු. මතෙව් තුමාය. (4) ශු. ස්තේපන් තුමාය.

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්න සඳහා A කොටසට ගැළපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| | **A කොටස** | **B කොටස** |
|---|---|---|
| 11. | ජාකොබ් තුමාගේ සහෝදරයා | ප්‍රසාද ස්නාපනය මගින්. |
| 12. | එඬේරික කාර්යට අප කැඳවයි. | කීකරුකම |
| 13. | ආබ්‍රහම් තුමාගේ පුත්‍රයා | ඒසව් තුමාය. |
| 14. | සත්වන පනත | ඊසාක් තුමාය. |
| 15. | පදවි පූජක පොරොන්දුවකි. | සොරකම් නොකරව. |

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.**

16. මරණාසන්න දරුවන්ට ප්‍රසාද ස්නාපනය දිය යුතු නැත. (    )

17. ජේසුස් වහන්සේ ස්වර්ගාරෝහණය වීමට පෙර අපෝස්තුළුවරුන්ට ධර්මදූත වගකීම පැවරූ සේක. (    )

18. ජාකොම් තුමාගේ නාමය දෙවියන් වහන්සේ "ඉශ්‍රායෙල්" ලෙස හැඳින්විය. (    )

19. ජපමාලයේ අභිරහස් වර්ග 05 කි. (    )

20. කොඩිගස එසවීමෙන් අනතුරුව නුවාන පැවැත්වේ. (    )

(ල. 2x20 = 40)

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. (i) ආබ්‍රහම් තුමාට මුහුණ දීමට සිදුවූ අභියෝග 02 ක් ලියන්න.
 (ii) ආමෝස් දිවැසිවරයා හඳුන්වනු ලබන අන්වර්ත නාමය කුමක්ද?
 (iii) පදවි පූජකවරු ලබා ගන්නා පොරොන්දු 02 ක් නම් කරන්න.
 (iv) සන්ධ්‍යා යාම යැදුමේ දී මෙනෙහි කරනු ලබන උදාන ගීය කුමක් ද?
 (v) ජේසුස් වහන්සේ පළමු වරට බිම වැටීම මෙනෙහි කරනු ලබන්නේ පාද නමස්කාරයේ කුමන ස්ථානයේදීද?
 (vi) ශුද්ධ වූ පැය භක්ති අභ්‍යාසය ආරම්භ කරන ලද්දේ කවුරුන් විසින්ද?
 (vii) මුල් කිතුනු සභාව තුළ ශුද්ධවූ සභාවට බොරු කියූ නිසා මරණයට පත් වූ යුවල කවුරුන්ද?
 (viii) සතරවන පනත නම් කරන්න.
 (ix) ශ්‍රී ලංකාව තුළ ඔබට යා හැකි ප්‍රධාන වන්දනා සිද්ධස්ථාන 02 ක් ලියන්න.
 (x) වන්දනා ස්ථාන වල පූජනීය බව සුරැකීමට ඔබට කළ හැකි ක්‍රියා 02 ලියන්න. (ල. 2x10=20)

02. (i) ''විජයග්‍රහණයේ අප ස්වාමිදූවගේ මංගල්‍යය'' ජපමාල මංගල්‍ය ලෙස වෙනස් කරන ලද්දේ කවුරුන් විසින්ද? (ල. 02)
 (ii) ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයේ සිදුවීම් මෙනෙහි කරනු ලබන අභිරහස් වර්ග 03 නම් කරන්න. (ල. 03)
 (iii) ජපමාල උච්චාරණය කිරීම තුළින් කිතුනු ඔබට ලැබෙන වරප්‍රසාද 05 ක් ලියන්න. (ල. 05)

03. (i) අන් අයගේ යහපත සඳහා සේවය කිරීමට අපව කැඳවනු ලබන්නේ කුමන ප්‍රසාද නිධානයෙන්ද? (ල. 02)
 (ii) එම ප්‍රසාද නිධානයේදී ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීමෙන් අප ලබන වගකීම් (කැදවීම්) 03 ක් ලියන්න. (ල. 03)
 (iii) පොදු පූජකවරයෙන් ඔබට පැවරෙන වගකීම් 05 ක් ලියන්න. (ල. 05)

04. (i) ජේසුස් වහන්සේ තෝරාගත් ගෝලයෝ දොළොස්දෙනා හැඳින් වූ නම් 2 ක් ලියන්න. (ල. 02)
 (ii) ජේසුස් වහන්සේ අනුව ගිය ප්‍රථම ශ්‍රාවකයෝ තිදෙනෙක් නම් කරන්න. (ල. 03)
 (iii) කිතුනු ශ්‍රාවකයෙකු ලෙස ඔබ පාසල තුළ ක්‍රියාකරන ආකාර 05 ක් ලියන්න. (ල. 05)

05. (i) දිවැසිවරයා හඳුන්වන හෙබ්‍රෙව් වචනය හා එහි අර්ථය ලියන්න. (ල. 02)
 (ii) ප්‍රධාන දිවැසිවරු තිදෙනා නම් කරන්න. (ල. 03)
 (iii) දිවැසිවරයෙකු ලෙස ඔබට කළ හැකි කාර්යයන් 05 ක් ලියන්න. (ල. 05)

06. (i) යාම යැදුම යනු කුමක්ද? (ල. 02)
 (ii) යාම යැදුම යදින අවස්ථා 03 ක් ලියන්න. (ල. 03)
 (iii) දිව්‍ය සත්ප්‍රසාද පෙරහැරට භක්තියෙන් සහභාගී විය හැකි ආකාර 05 ක් ලියන්න. (ල. 05)

07. (i) පැවිදි නිකායන් බෙදෙන ප්‍රධාන කොටස් 02 ක නම් කරන්න. (ල. 02)
 (ii) පැවිදි පූජකවරු ලබා ගන්නා වේදහාර 03 ලියන්න. (ල. 03)
 (iii) පූජකවරුන්ගේ කැඳවීම වඩාත් සාර්ථක කර ගැනීමට අවශ්‍ය ශක්තිය පතා යාච්ඤාවක් නිර්මාණය කරන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. (2) 02. (1) 03. (3) 04. (1) 05. (4) 06. (3) 07. (2) 08. (1) 09. (4) 10. (3)

11. ඒසව්ය. 12. ප්‍රසාද ස්නාපනය මගින් 13. ඊසාක් තුමාය. 14. සොරකම් නොකරව 15. කීකරුකම

16. (X) 17. (✓) 18. (✓) 19. (X) 20. (✓)

(ල. 2x20=40)

## II කොටස

01. (i) විශාල ජාතියක් ඇතිකිරීම, සංචාරක ජීවිතයක් ගත කිරීමට සිදු වීම නොදන්නා දේශයකට යාමට සිදු වීම.
    (ii) සමාජ සාධාරණත්වයේ දිවැසිවරයා
    (iii) කීකරුකම, පූජක බඹසර
    (iv) මරිය උදාන ගීය.
    (v) තුන්වන ස්ථානය
    (vi) මර්ගරීතා මරියතුමිය
    (vii) අනනියස් සහ සපීරා
    (viii) මව්පියන්ට සංග්‍රහ කරව
    (ix) මරුදමඩු දේවමාතා සිද්ධස්ථානය, තලවිල ශාන්ත ආනා සිද්ධස්ථානය, තේවත්ත ලංකා අප ස්වාමිදුවගේ බැසිලිකාව, මාතර ජයලත් අප ස්වාමිදුවගේ සිද්ධස්ථානය.
    (x) භක්ති අභ්‍යාස වලට සහභාගී වීම, සංවර ඇඳුම් භාවිතය, අන් අය හා සහයෝගයෙන් කටයුතු කිරීම වැනි පිළිතුරු වලට ලකුණු ලබා දෙන්න. (ල. 2x10=20)

02. (i) එකොළොස්වන ක්ලෙමෙන්ට් ශුද්ධෝත්තම පියතුමා. (ල. 02)
    (ii) සොම්නස් අභිරහස්, දොම්නස් අභිරහස්, මෝක්ෂ අභිරහස්, ආලෝකයේ අභිරහස් (ල. 03)
    (iii) ♦ දේව ආදරයට නතු වීම. ♦ දේව ආශිර්වාදය ලැබීම. ♦ කරදර බාධකවලින් ආරක්ෂාව. ♦ දේව මාතාවහන්සේ සමඟ යහපත් සබඳතාවක් පවත්වා ගැනීම. ♦ අභියෝගවලට මුහුණ දීමට හැකි වීම. (ල. 05)

03. (i) ප්‍රසාද ස්නාපනය (ල. 02)
    (ii) ♦ එඬේරික (රාජකීය) ♦ පූජක ♦ දිවැසිවර (ල. 03)
    (iii) ♦ දේව වචනයට සාක්ෂි දැරීම. ♦ එකිනෙකා වෙනුවෙන් යැදීම. ♦ දේව වාක්‍ය කියවීම. ♦ පාසල්වල නායකත්වය ගනිමින් සේවය කිරීම. ♦ ගායනා කණ්ඩායමෙහි ක්‍රියාකාරී සාමාජිකයෙකු වීම. (පිටු අංක 56 වගුව) (ල. 05)

04. (i) ප්‍රේරිතයෝ, අපෝස්තුලුවරු. (ල. 02)
    (ii) පේදුරු, ජුවාම්, ජාකොබ්, ඇන්ඩෘ (ල. 03)
    (iii) ♦ සත්‍යයට සාක්ෂි දැරීම. ♦ ජේසුස් වහන්සේව අන් අයට හඳුන්වා දීම. ♦ අන් අය වෙනුවෙන් මැදිහත් වීම. ♦ මිතුරු මිතුරියන් යහමඟට ගැනීම. ♦ කිතුනු ගුණාංගවලින් යුක්ත දරුවෙකු ලෙස ජීවත් වීම..... ආදී කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

05. (i) නබී, දෙවියන් වහන්සේ වෙනුවෙන් කතා කරන තැනැත්තා (ල. 02)
    (ii) යෙසායා, ජෙරමියා, එසකියෙල් (ල. 03)
    (iii) ♦ දෙවියන් වහන්සේගේ අණට කීකරු වීම. ♦ සත්‍යයට සාක්ෂි දැරීම. ♦ දේව වචනය අන් අයට කියා දීම. ♦ කතෝලික විශ්වාසයට අනුව ජීවත් වීම. ♦ අයහපත පිටු දැකීම..... වැනි කරුණු වලට ලකුණු ලබා දෙන්න. (ල. 05)

06. (i) දවසේ නිශ්චිත කාල වේලා වලදී විශේෂයෙන්ම ගීතාවලියේ තෙහිලි ගී පදනම් කරගෙන සිදු කෙරෙන ප්‍රශංසා යාච්ඤා පිළිවෙතකි. (ල. 02)
    (ii) උදා යාම යැදුම, දිවා යාම යැදුම, සැඳෑ යාම යැදුම, රාත්‍රී යාම යැදුම. (ල. 03)
    (iii) * පෙරහැරට පෙර පැවැත්වෙන දිව්‍ය පූජාවට හා ශුද්ධ වූ පැයට සහභාගී වීම. * අනවශ්‍ය කතා බහෙන් වැළකීම. * පෙරහැරේදී ගැයෙන ගීතිකා හා යාච්ඤා වලට භක්තියෙන් සහභාගී වීම. * සරල චාම් වස්ත්‍රයෙන් සැරසී සහභාගි විම. * දෙදෙනා හෝ තිදෙනා බැගින් පිළිවෙළකට ගමන් කිරීම. (ල. 05)

07. (i) පැවිදි පූජක, පූජක නොවන පැවිදි (ල. 02)
    (ii) දිළිඳුකම, කීකරුකම, ව්‍රතශුද්ධිය. (ල. 03)
    (iii) ශිෂ්‍යයා ලියා ඇති පිළිතුරුට අනුව ලකුණු ලබා දෙන්න. (ල. 05)